**ශීර්ෂය 263- හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) කොට්ඨාශ හා ගම් මට්ටමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ කටයුතු සමායෝජනය කිරීම මෙන්ම නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමටත් , එහිදී අදාල ගෙවීම් සහ ආදායම් රැස්කිරීම.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයින් වශයෙන් කටයුතු කරමින් කරනු ලබන ගෙවීම් සහ ආදායම් රැස් කිරීම.

(ඇ) විමධ්‍යගත අයවැය වැඩසටහන හා වෙනත් සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාල ගෙවීම්.

(ඈ) පළාත් සභාවට පැවරී ඇති කාර්යයන් සඳහා අවශ්‍ය විට සහභාගීවීම සහ එහිදී කළ යුතු වන ආදායම් රැස් කිරීම සහ ගෙවීම් කටයුතු.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) හම්බන්තොට
(ආ) අම්බලන්තොට
(ඇ) තිස්සමහාරාම
(ඈ) ලුණුගම්වෙහෙර
(ඉ) සූරියවැව
(ඊ) අඟුණකොළපැලැස්ස
(උ) තංගල්ල
(ඌ) බෙලිඅත්ත
(එ) ඕකෙවෙල
(ඒ) වීරකැටිය
(ඔ) වලස්මුල්ල
(ඕ) කටුවන

## 1.3 විගණන විෂය පථය

----------------------

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 14 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණය

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විගණන විමසුම් වලට පිළිතුරුදීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2014 ජුනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර , එම විමසුම්වලට අදාල ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.43,277,861 ක් විය.

**(ආ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.778,985,452 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.776,123,024 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,862,428 ක් හෙවත් සියයට 0.36 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදන | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 650,872,352 | 650,559,228 | 313,124 | 0.04 |
| මූලධන | 128,113,100 | 125,563,796 | 2,549,304 | 1.99 |
| එකතුව | 778,985,452 | 776,123,024 | 2,862,428 | 0.36 |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.1,991,305,873 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.716,036,400 ක් හා රු.1,269,791,882 ක් වශයෙන් එකතුව රු.1,985,828,282 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.2,781,753

ක් හා රු.2,695,838 ක් වශයෙන් රු.5,477,591 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එය ලබා දෙන ලද ප්‍රතිපාදනයෙන් සියයට 0.27 ක් වි තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 03 ක් විසින් ලබා දෙන ලද ප්‍රතිපාදන එකතුව රු.18,622,532 ක් වි තිබුණත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු.20,479,129 ක් උපයෝජනය කිරීම නිසා ලබා දෙන ලද ප්‍රතිපාදනය රු.1,856,597 කින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 05 ක ඉ-ශිල්පාගාර සඳහා පරිගණක පුටු ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013-48 දරන ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පදනම් කර ගෙන එකක් රු.6,061 ක් බැගින් වූ Piyestra ECL001 ඇඳි සහිත කැරකෙන Low Back වර්ගයේ ලිපිකරු පුටු 100 ක් රු.606,054 ක් වැය කර මිලදී ගෙන තිබුණි. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 2013-48 දරන ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි රු.4,600 ක් වූ අඩු මිල ගණන් යටතේ පරිගණක පුටු මිලදී ගත්තේනම් රු.146,054 ක මුදලක් ඉතිරිකර ගත හැකිව තිබුණි. අවශ්‍යතාවයට සරිලන පරිගණක පුටු මිලදී නොගෙන වැඩි මිලට ලිපිකරු පුටු මිලදී ගැනීම නිසා ඉහත වැඩිපුර ගෙවීම් සිදුවී ඇත.
- 2012 වර්ෂයේ “එක් ගමකට එක් වැඩක් ” වැඩසටහන යටතේ මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතීන් සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී කොන්ක්‍රීට් කරන ලද මාර්ගවල තත්ත්ව පරීක්ෂාවක් සිදුකිරීම සඳහා වන විශේෂිත මුදලක් ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම අනුමත නොකරන බව 2012 මැයි 29 දිනැති අංක ආස/සං/ගමනැගුම/සමස්ථ අධීක්ෂණ - 2012 දරන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් දන්වා තිබුණත්, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කර තිබු කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති 30 ක තත්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් රු.286,520 ක් ගෙවා තිබුණි.
- කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බෙන්ගමුකන්ද - වේවැල්දෙනිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සඳහා 2012 මැයි 30 දින ගොවි සංවිධානයක් සමඟ රු.980,392 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණු අතර විගණිත දිනය වූ 2013 ජුලි 11 දින වන විට කොන්ත්‍රාත්කාර සමිතියට රු.871,676 ක් ගෙවා තිබුණි. භෞතික පරීක්ෂාවේදී පාරෙහි තැනින් තැන

මතුපිටට ගල් මතුවී තිබුණු අතර පාර දෙපස උරහිසේ ඇතැම් ස්ථානවලින් ගල් ගැලවී ඉවත් වී තිබීම හා නාම පුවරුව සවිකර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

- කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දංගලකන්ද බතලකොටුව මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය ඉටුකිරීම සඳහා 2012 ජුලි 12 දින ගොවි සංවිධානයක් සමඟ රු.980,392 කට ගිවිසුමකට එළඹ තිබුණි. 2013 ජුලි 11 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.870,209 ක් ගෙවා තිබුණි. විගණන භෞතික පරීක්ෂාවේදී කොන්ක්‍රීට් පාරෙහි බොහෝ ස්ථානවල මතුපිට සිමෙන්ති තට්ටුව සේදී ගල් මතුවී තිබුණු බව නිරීක්ෂණය විය.
- අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2013 දිවිනැගුම වැඩසටහන යටතේ වානිජ වගාව සඳහා පොල්පැල බෙදාදීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවට අනුව තෝරාගත් ප්‍රතිලාභීන් 09 දෙනෙකුට ලබාදී තිබු පොල්පැල 1,652 න් පොල්පැල 1,300 ක් සිටුවා නොතිබුණු බවත් ඒවා නිවාස අසල ගොඩගසා තිබු බවත් නිරීක්ෂණය විය.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 26301 | 40,000,000 | 28,329,345 | 25,000,000 | 28,576,118 | 155,000,000 | 132,103,870 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.307,080 ක ණය ශේෂ වසර 1 සිට වසර 05 දක්වා කාල පරාසයක සිට හිඟහිටව පැවැතුණි.

(ii) 1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.260,122 ක ණය ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

**------------------------**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0000/00/0039/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 250,190,316 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 23 ක් වෙතින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලබාදී තිබුණු එකතුව රු.13,858,327 ක් අදාල කාර්යභාරයන් ඉටු නොකර 2014 සැප්තැම්බර් 30 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් තැන්පත් ගිණුම්වල රඳවා ගෙන තිබුණි.

## 1.6 වත්කම් කළමනාකරණය

**----------------------------**

වත්කම් කළමනකාරණය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | අඟුණකොළපැලැස්ස - 01 | අවුරුදු - 01 |
| (ii) | වාහන | දි.ලේ.කාර්යාලය - ත්‍රීවිලර් - 01 | අවුරුදු - 02 |
| | | කටුවන - ට්‍රැක්ටර් ටේලර් - 01 | අවුරුදු - 17 |

(ආ) නැණසල මධ්‍යස්ථානය වසා දැමීම

--------------------------------------

සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවත්වාගෙන ගිය නැණසල මධ්‍යස්ථානය වසා දැමීම නිසා 2012 අගෝස්තු 23 වන දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය භාරගෙන තිබු පරිගණක උපකරණ හා ඡායා පිටපත් යන්ත්‍ර ආදී උපකරණ වර්ග 19 ක් 2013

ඔක්තෝබර් 25 දින වන විටත් නිෂ්ක්‍රීයව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාකර තිබුණි.

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX වැනි පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - | රජයේ නිවාසවල බදු කාලය වර්ෂ 05 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 08 දෙනෙකු නිල නිවාසවල පදිංචි වී සිටි කාලය වර්ෂ 5 ඉක්මවා තිබුණි. |
| (ii) XIX වැනි පරිච්ඡේදයේ 5.6 හා 5.7 වගන්ති | 130,280 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී නිල නිවසෙහි පදිංචිව සිටි කළමනාකරණ සහකාර නිලධාරිනියගෙන් 2009 මැයි සිට 2012 දෙසැම්බර් දක්වා රජයට අයවිය යුතු කුලී ආදායම රු.130,280 ක් අඩුවෙන් අයකර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 104 (3) | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කැබ් රථය 2012 ජුලි 02 දින අනතුරකට භාජනය වී තිබුණත් විගණිත දිනය වූ 2013 ජුලි 26 දින වන විටත් ප්‍රාරම්භක වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය | 505,947 | කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2012 ජනවාරි සිට 2013 මැයි දක්වා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් සනාථ කරගෙන නොතිබුණි. |

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| ලුණුගම්වෙහෙර රණවරණාව අංක 01 මැතිවරණ නිවාස මාර්ගය අවට ජලය බැස්සවීම සඳහා කිරිදිඔය දක්වා කාණු පද්ධතියක් ඉදිකිරීම | 2,536,925 | 2013.09.01 | අවට ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය |

| | | | |
|---|---|---|---|
| තිස්සමහාරාමය විජයපුර ග්‍රාම නිලධාරී වසමේ වාරිමාර්ග ඇල පද්ධතියේ බෝක්කු 02 ක් සකස් කිරීම | 30,000 | 2013.12.30 | කාලය ප්‍රමාණවත් නොවීම , අදාල ව්‍යාපෘතියට වෙන්කළ මුදල ප්‍රමාණවත් නොවීම. |

**1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**---------------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**------------------------**

තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව වර්ෂ 03 ට වැඩි උපලබ්ධි නොවු තැන්පතුවල වටිනාකම රු. 6,470 ක් විය.

**1.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-----------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) දිස්ත්‍රික් ලේකම් නිල නිවස වටා තාප්පය ඉදිකිරීම**

**-----------------------------------------------------**

**මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i)** දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිකිරීමේ ඇස්තමේන්තුවේ විෂය අංක ආර් 03 යටතේ තාප්පය ඉදිකිරීම සඳහා නිශ්චිත වැඩ කොටස් නොදක්වා රු. 500,000 ක් " Provisional sum"ලෙස ඇස්තමේන්තු කර තිබු අතර 2013 වර්ෂය අවසානයට අදාල කොන්ත්‍රාත්කරුට විධිමත් අනුමැතියකින් තොරව තාප්පය ඉදිකිරීම වෙනුවෙන් රු.1,545,384 ක් ගෙවා තිබුණි.

**(ii)** 2014 වර්ෂයේ නිල නිවාසයේ තාප්පයේ ඉතිරි කොටස සඳහා නව ඇස්තමේන්තුවක් සකස් කිරීමේදී 2013 වර්ෂයේදී ඉදිකර තිබුණු කොටස් ඉවත්කර ඉතිරි වැඩ කොටස් සඳහා ඇස්තමේන්තුවක් සකස් නොකර මුළු තාප්පය සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඉන් රු.500,000 ක් අඩුකර රු.6,993,874 ක වටිනාකමකට නිල නිවාසය ඉදිකළ කොන්ත්‍රාත්කරු සමඟ 2014 පෙබරවාරි 26 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2014 ජුනි 24 දින වන විටත් අදාල ගිවිසුමට දිස්ත්‍රික් ලේකම්වරයා අත්සන් කර නොතිබුණි.

**(iii)** 2013 වර්ෂයේ තාප්පය ඉදිකිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවන ලද රු.1,045,384 ක මුදල කඩිනමින් අයකර ගැනීමකින් තොරව 2014 ජුනි 05 දින දිස්ත්‍රික් ලේකම් නිල නිවසේ ඉදිකිරීමේ අවසන් ගෙවීම් වාර්තාවෙන් එම මුදල අත්හැර ඒ වෙනුවට 2014 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් නිල නිවාසයේ වෙනත් වැඩ වෙනුවෙන් එම මුදල වැයවන ආකාරයට අවසන් ගෙවීම් වාර්තාව සකස් කර පියවා තිබුණි.

**(iv)** 2014 වර්ෂයේදී මෙම තාප්පය ඉදිකිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමක් මගින් කොන්ත්‍රාත්කරු තෝරාගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් නිල නිවස වටා තාප්පය ඉදිකිරීමේ කර්මාන්තය ඉටුකරවා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2014 පෙබරවාරි 26 දින රු.6,993,874 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද 2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිකිරීම වෙනුවෙන් රු.6,000,000 ක ප්‍රතිපාදනය පමණක් සළසාගෙන තිබුණි.

**(ආ) දේශීය ගුවන් ගමන් වාරිකා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මාණ්ඩලික නිලධාරීන් 30 දෙනෙකු වෙනුවෙන් එක් නිලධාරියෙකුට රු.5,984 ක් බැගින් මත්තල සිට කටුනායක දක්වා හා කටුනායක සිට මත්තල දක්වා ගුවන් මගින් ගමන් කිරීමට 2013 දෙසැම්බර් 31 දින රු.179,520 ක් ගුවන් සමාගමක් වෙත ගෙවීමට චෙක්පත ලියා විගණිත දිනය වූ 2014 ජුනි 02 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. දේශීය ගුවන් ගමන් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සළසාගෙන නොතිබු අතර විධිමත් අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිකිරීමේ ප්‍රාග්ධන වියදමක් යටතේ මෙම පුනරාවර්තන වියදම ගිණුම්ගත කර තිබුණි.

**(ඇ) ටයර් මිලදී ගැනීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඩබල් කැබ් රථවලට අවශ්‍ය පොටවල් 6 PR ටයර් මිලදී ගැනීම සඳහා 2013/66 ප්‍රසම්පාදන තීරණය අනුව 215/70 x 16 Road stone වර්ගයේ ටයර් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දින එක්තරා පෞද්ගලික ආයතනයක් වෙත රු.660,000 ක් ගෙවා 215/70 x 16 Maxxis වර්ගයේ පොටවල් 5PR සහිත ටයර් 40 ක් මිලදී ගෙන තිබුණි. වාහන සඳහා අවශ්‍ය පොටවල් 6 PR ටයර් බව ප්‍රසම්පාදන කමිටුව පෙර අවස්ථාවේදී තීරණය කර මිලගණන් කැඳවා තිබුණත්, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයකින් තොරව පොටවල් 5PR ටයර් මිලදී ගෙන තිබුණි.

## 1.11 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පටිපාටියෙන් බැහැරවීම

----------------------------------------------------------------

(i) 2013 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා තිබූ ප්‍රසම්පාදන ලේඛනය පරීක්ෂාවේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් සහභාගී නොවී ප්‍රසම්පාදන තීරණ ගනු ලැබූ අවස්ථාවන් පහත පරිදි නිරීක්ෂණය විය.

| සාමාජිකයින්ගේ සහභාගීත්වය | ප්‍රසම්පාදන තීරණ ගණන | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| සාමාජිකයින් තිදෙනාම සහභාගී වී නොතිබීම | 06 | 15,892,104 |
| සාමාජිකයින් දෙදෙනෙකු සහභාගී වී නොතිබීම | 11 | 8,919,042 |
| එක් සාමාජිකයෙකු සහභාගී වී නොතිබීම | 07 | 25,399,882 |
| එකතුව | 24 | 50,211,028 |

(ii) අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2013 වර්ෂයේ දින 33 කදී ප්‍රසම්පාදන කමිටුව රැස්වී තීරණගෙන තිබූ නමුත් කමිටුවට සහභාගී වූ බවට අත්සන් කර තිබූ දින 23 කදී කමිටුවේ සභාපති වන ප්‍රාදේශීය ලේකම්වරිය කාර්යාලයේ රැදී සිට නොතිබුණි. එම දිනවල කොට්ඨාශය තුළ හා කොට්ඨාශයෙන් පිටත රාජකාරි කටයුතුවල නිරත වී ගමන් වියදම්ද ඇය විසින් ලබාගෙන තිබුණි.

(iii) අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයට අදාල ප්‍රසම්පාදන තීරණ 13 ක් විගණිත දිනය වූ 2014 පෙබරවාරි 12 දිනෙන් පසුව ප්‍රසම්පාදන ලේඛනයට ඇතුළත් කර තිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 9.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.200,000 කට වැඩි වාහන අලුත්වැඩියා සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහනයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2013

අප්‍රේල් 04 දින එක්තරා පුද්ගලික සමාගමක් වෙත රු. 543,600 ක මුදලක් ගෙවා තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

**--------------------------------------**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ඉංජිනේරු නිල නිවස ඉදිකිරීමේ කර්මාන්තය සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් විධිමත් අධිකාරී බලයකින් තොරව පහත සඳහන් වියදම් කර තිබුණි.

(i) කොන්ත්‍රාත්කරු ලවා රු.641,945 ක අමතර වැඩ ඉටුකරවාගෙන තිබු නමුත් අමතර වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකසා නොතිබුණි.

(ii) ඇස්තමේන්තුගත ඒකක 93 න් 39 කට අදාලව රු.806,985 ක අතිරේක වැඩ (Excess work ) ඉටුකරවා ගෙන තිබුණි.

**(iii)** ඉංජිනේරු නිල නිවසට තිරරෙදි දැමීම වෙනුවෙන් රු.83,150 ක්ද, කාර්ය මණ්ඩලය සඳහා ටී-ෂර්ට් මිලදී ගැනීම වෙනුවෙන් රු.80,000 ක්ද වශයෙන් එකතුව රු.163,150 ක් ඉංජිනේරු නිල නිවස ඉදිකිරීම සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන වලින් වැය කර තිබුණි.

**1.12 කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) පවිත්‍රතා සේවා සඳහා ගෙවීම් කිරීම**

**--------------------------------------**

මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ පවිත්‍රතා සේවා සැපයීම වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව සෑම දිනකම පරීක්ෂකවරුන් 03 දෙනෙකු හා කම්කරුවන් 32 දෙනෙකු නියමිත කාලසීමාව තුළ සේවයේ යෙදවීම කළ යුතු විය. 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා දෛනිකව සේවකයින්ගේ පැමිණීමේ අඩුවක් සිදුවී තිබුණද, ඒ පිළිබඳව නොසළකා හැර ගෙවීම් කිරීමේදී සේවයට වාර්තා නොකළ සේවක දින 554 ක් වෙනුවෙන් රු.301,775 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) **සන්නිවේදන ඇන්ටනා පද්ධතිවලින් ගාස්තු අයවීම**

**--------------------------------------------------------**

රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණයේ සන්නිවේදන සේවා පහසුකම් සැපයීමේ බෙදාහැරීම් ඇන්ටනා පද්ධති ස්ථාපනය කර පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික

දූරකථන සමාගම් තුනක් සමඟ ගිවිසුම්වලට එළඹීම හා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පරිපාලන සංකීර්ණයේ ගොඩනැගිලිවල මෙම සන්නිවේදන ඇන්ටනා පද්ධති සවිකිරීමට කිසිදු අනුමැතියකින් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභසාධක සංගමයේ ලේකම්වරයා විසින් පෞද්ගලික දූරකථන සමාගම් දෙකක් සමඟ දිගුකාලීන ගිවිසුම්වලට එළඹ තිබුණි.

(ii) ගිවිසුම් කාලය හා මාසික ගාස්තුව තීරණය කරන ලද පදනමක් පිළිබඳව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) පෞද්ගලික දූරකථන සමාගම් දෙකකින් 2012 ජනවාරි සිට 2013 නොවැම්බර් 20 දින දක්වා බදු මුදල් ලෙස රු.2,685,000 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභසාධක සංගමයේ ගිණුමට ලැබී තිබූ අතර ඉන් රු.2,243,400 ක් පමණක් රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. එදිනට වූ ඉතිරි රු.441,600 ක මුදල විගණිත දිනය වූ 2013 නොවැම්බර් 25 දින වන විටත් සුභසාධක සංගමයේ ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

(iv) ඇන්ටනා පද්ධති ස්ථාපනය කර පවත්වාගෙන යාම සඳහා ඊට අදාලව වැයවන විදුලිය වෙනුවෙන් විගණිත දිනය වූ 2013 නොවැම්බර් 25 දින වන විට අදාල ආයතන තුනෙන් රු. 885,644 ක මුදලක් අයකරගත යුතුව තිබුණි.

(ඇ) **ආපන ශාලාව බදුදීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපන ශාලාව බදුදීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හම්බන්තොට පරිපාලන සංකීර්ණයේ පිහිටි ආපන ශාලාව පවත්වාගෙන යාමට අදාලව 2012 වර්ෂයේදී මසකට රු.5,000 බැගින් මාස 09 ක් වෙනුවෙන් රු.45,000 ක මුදලක් රාජ්‍ය ආදායමට නොගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුභසාධක සංගමයේ ගිණුමට බැරකර තිබුණි. 2012 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස වෙනුවෙන් බදු මුදල් අයකර ගෙනද නොතිබුණි.

(ii) 2013 ජනවාරි සිට මැයි දක්වා බදු ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව පුද්ගලයෙකු විසින් ආපන ශාලාව පවත්වා තිබුණු අතර මාසික කුලී අයවීමක්ද සිදු කර නොතිබුණි.

(iii) 2013 ජුනි සිට 2014 මැයි දක්වා ආපන ශාලාව බදුදීමට අදාල ලංසු ආකෘති පත්‍රයේ පොදු කොන්දේසි 2.4 ප්‍රකාරව තෝරාගත් ලංසුකරු පිළිගත් බැංකුවක රු.200,000 ක් වටිනා කාර්යසාධන ඇප බැඳුම්කරයක් ඉදිරිපත් කර ගිවිසුමකට

ඇතුළත් විය යුතු වුවත්, 2013 මැයි 29 දින ගිවිසුමට ඇතුළත් වුවද, විගණන දිනය වූ 2013 සැප්තැම්බර් 24 දින වන විටත් කාර්යසාධන ඇප බැදුම්කරයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. මාසික කුලී අයකිරීමකින්ද තොරව අදාල ආපන ශාලාව පවත්වාගෙන යෑමට කාර්යාලය විසින් ඉඩකඩ සළසා දී තිබුණි.

(iv) 2012 ජනවාරි සිට 2013 මැයි දක්වා ආපන ශාලාව පවත්වාගෙන ගිය පුද්ගලයාගෙන් විදුලි ඒකක 2,122 ක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයවිය යුතු රු.50,397 ක් විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 24 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ඈ) **නැවත සේවයේ පිහිට වූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු මුදල් අයකර නොගැනීම**

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටි කළමනාකරණ සහකාර නිලධාරියෙකුගේ 2002 මාර්තු 15 දින වැඩ තහනම් කර තිබුණි. 2004 මාර්තු 12 දිනැති ලිපිය මගින් ඔහු නැවත සේවයේ පිහිටුවා තිබුණි. එම ලිපියේ සඳහන් කර තිබූ පරිදි රජයට සිදුව තිබුණු රු.20,900 ක් වූ අලාභයෙන් රු.10,000 ක්ද, වැඩ තහනමට ලක්ව තිබූ වැටුප් නොගෙවන ලද කාලයට අදාල දේපල ණය වාරිකවල එකතුව වූ රු.11,440 ක්ද, හා පොළිය රු.20,842 ක්ද විගණිත දිනය වූ 2013 ඔක්තෝබර් 10 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 39 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 30 | 13 | 17 | - |
| (iii) | ද්විතියික මට්ටම | 991 | 832 | 226 | 67 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 122 | 113 | 12 | 03 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 05 | - | 04 |
| | එකතුව | 1189 | 1002 | 261 | 74 |